# රාජපක්ෂ රජයේ ආර්ථික සංවර්ධනය ඉලක්කම් හරඹයක් බව සජිත් ඔප්පු කළොත් මන්ත්‍රීකමෙන් මා ඉල්ලා අස්වෙනවා

## - බන්දුල ගුණවර්ධන

**ජයසූරිය උඩුකුඹුර**

ඉලක්කම් 'පිල්මාරි'වලින් පසුගිය රජයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ සාවද්‍ය සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කර ඇති බව සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයා ඔප්පු කළොත් තමන් මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වන බව පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය බන්ධුල ගුණවර්ධන මහතා කීවේය.

කොළඹදී ඊයේ (25දා) පැවැති මාධ්‍ය හමුවකට සහභාගි වෙමින් මන්ත්‍රීවරයා මේ බව සඳහන් කළේය.

සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයා පසු දවසක ප්‍රසිද්ධ රැස්වීමකදී ප්‍රකාශ කළා (අදාළ දර්ශන පෙන්වමින්.....) පසුගිය රජය ආර්ථික සංවර්ධනය පිළිබඳ සාවද්‍ය සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරලා තිබෙන්නේ ඉලක්කම් පිල්මාරි දාලා කියලා. ජනාධිපති අපේක්ෂකයකු වීමේ අපේක්ෂාවෙන් සිටින සජිත් ප්‍රේමදාස මහතාගේ මේ ප්‍රකාශය ඒකාබද්ධ විපක්ෂයේ ආර්ථික පර්යේෂණ ඒකකය විශේෂ අවධානයට යොමුකර තිබෙනවා.

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා යුද්ධය නිමා කොට රට සංවර්ධනය කිරීම ගැන හෝ එකල ඇතිවූ ආර්ථික සංවර්ධනය බොරුවක් කියා හෝ ඔප්පු කිරීම සඳහා ලබන අඟහරුවාදා උදේ 10.00 දක්වා සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයාට කල්දෙනවා. එදාට පෙර ඔහු කියපු කාරණය සත්‍ය බව ඔප්පු කළොත් බදාදා 12.00ට පෙර තමන් මන්ත්‍රී ධුරයෙන් ඉවත් වන බව ගුණවර්ධන මහතා කීවේය.